# සිංහල භාෂා ප්‍රවීණතාව - පැය 200

| අනු අංක | අරමුණු | අන්තර්ගතය | ඉගෙනුම් පල | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද | කාලය |
|---|---|---|---|---|---|
| **1.0**<br><br>**1.1** | සවන්දීම හා කථනය<br><br>විවිධ අවස්ථාවල භාවිත කෙරෙන යෙදුම් හඳුනා ගෙන උචිත පරිදි ව්‍යවහාර කිරීම | • සුබ පැතුම්<br>-ආයුබෝවන්<br>-සුබ උදෑසනක් වේවා<br>-සුබ රාත්‍රියක් වේවා-<br>-සුබ සන්ධ්‍යාවක් වේවා<br>-සුබ උපන් දිනයක් වේවා<br>-සුබ අලුත් අවුරුද්දක් වේවා<br>-සුබ නත්තලක් වේවා ආදී වශයෙන්<br>• විධාන<br>-මෙහාට එන්න.<br>-වාඩිවෙන්න<br>-මෙතැනින් ඇතුළු වන්න.<br>• ඉල්ලීම්<br>-කරුණාකර වාඩිවෙන්න.<br>-කරුණාකර ඉඩ දෙන්න.<br>-කරුණාකර මදක් රැදී සිටින්න.<br>• සමු ගැනීම්<br>-ආයුබෝවන්<br>-ගිහින් එන්නම්<br>තම ආගමට අනුව සුදුසු ආශිර්වාදයක් ප්‍රතිචාර වශයෙන් දැක්වීම.<br>- බුදු සරණයි / දෙවි පිහිටයි.<br>• ප්‍රතික්ෂේප කිරීම්<br>-සමාවෙන්න දැන් බැහැ.<br>-සමාවෙන්න අද බැහැ හෙට එන්න.<br>-සමාවෙන්න ඔබේ ඉල්ලීම ඉටු කරන්න අපහසුයි. | • අවස්ථෝචිත ව සුබ පැතුම් ප්‍රකාශ කරයි.<br>-උචිත පරිදි විධානයේ යෙදෙයි.<br>-ආචාරශීලී ලෙස ඉල්ලීම් කරයි.<br>-සමුගැනීමේ දී ආචාරශීලී බව පළ කරයි.<br>-ප්‍රතික්ෂේප කිරීමේ දී ආචාරශීලි බව පළ කරයි. | • ආදර්ශනය<br>• අනුකරණය<br>• භූමිකා රංගනය | පැය 10යි |

| | | | | | |
|---|---|---|---|---|---|
| **1.2** | **අවස්ථානුකූලව තමා හා අන් අය හඳුන්වා දීම.** | • **තමා හඳුන්වා දීම.**<br>**-මම........**<br>**-මගේ නම.....**<br>**-මගේ ගම.**<br>**-මගේ උපන් දිනය**<br>**-මගේ පාසල**<br>**-මගේ මව**<br>**-මගේ පියා**<br>**-මගේ රැකියාව ආදි වශයන්**<br><br>• **අන් අය හඳුන්වා දීම.**<br>**-එයා**<br>**-එයාගේ නම....**<br>**-එයාගේ පාසල....ආදි වශයෙන්**<br>**- එයා ගුරුවරයෙක්/ වෛද්‍යරයෙක්** | • **තමා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.**<br>• **අන් අය හඳුන්වා දිමට ඉදිරිපත් වෙයි.** | • **ආදර්ශනය**<br>• **කණ්ඩායම් ක්‍රියාකාරකම්** | **පැය06යි** |
| **1.3** | **තමා අවට පරිසරය හඳුනා ගැනීම සඳහා සංවාදයේ යෙදීම(ජීව අජීව)** | **අසල් වැසියන්,ඥාතීන්.**<br>**-නිවසේ ගෘහ උපකරණ, සුරතල් සතුන්, ගංගා ඇළදොළ, ගම්, නගර**<br>**-පාසල රෝහල , පන්සල, පල්ලිය , කෝවිල ආශ්‍රිත චරිත** | • **වාක්කෝෂය පෝෂණය කර ගනිමින් සංවාදයේ නියැළෙයි.**<br>• **සරල බසින් අදහස් ප්‍රකාශ කරයි.** | • **අනුකරණය**<br>• **සාකච්ඡා** | **පැය 04යි** |

| | | | | | |
|---|---|---|---|---|---|
| **1.4** | එදිනෙදා අදහස් ප්‍රකාශ කිරීම සඳහා කථන ව්‍යවහාරය විධිමත් ව යොදා ගැනීම | • සර්ව නාම<br>-මම,මං,අපි,එයා,ඔයා<br><br>-ඔබ,ඌ,උන්,ඒක,ඒවා<br><br><u>ලිංග භේදය</u><br><br>• පුරුෂ ලිංග නාම<br>තාත්තා, අයියා, මල්ලි, මාමා,බාප්පා, මහප්පා, අත්තා/සීයා<br>• ස්ත්‍රී ලිංග නාම<br>අම්මා,අක්කා,<br>නංගි,පුංචි අම්මා,<br>නැන්දා,ලොකු අම්මා, කිරි අම්මා/ආච්චි අම්මා<br>• කාල භේදය<br>වර්තමාන අතීත<br><br>ඒක වචන<br><br>යනවා ගියා<br>කනවා කෑවා<br>බලනවා බැලුවා<br>පාඩම් කරනවා පාඩම් කළා/ කෙරුවා<br>දුවනවා දිව්වා<br>ඉන්නවා හිටියා ආදී ය.<br>• ප්‍රශ්න වාචී වචන<br>කවු ද ? / කාව ද?<br>කොහේ ද? කොතැන ද?<br>කොහොම ද?<br>මොනව ද?<br>කීය ද?<br>කාට ද? | • සර්ව නාම හඳුනා ගෙන නිවැරදි ව භාවිතා කරයි.<br>• පුරුෂ ලිංග නාම පද හා ස්ත්‍රී ලිංග නාම පද හඳුනා ගෙන භාෂාව භාවිත කරයි.<br>• හඳුනා ගත් වචන ඇසුරෙන් අදහස් ප්‍රකාශ කරයි.<br>• වර්තමාන හා අතීත කාල ක්‍රියා පද හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• ප්‍රශ්නවාචී පද හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br><br>• ප්‍රශ්නවාචී පද නිවැරදි ව භාවිත කරමින් කරුණු විමසයි. | • භූමිකා රංගනය<br>• අනුකරණය<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් | පැය **16** යි |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1.5 | එදිනෙදා සිදුවීම් ඇසුරෙන් සංවාදවල යෙදීම | උදාහරණ<br>-වෙළෙඳ සැල / වෙළෙඳ පොළ<br>-බස් නැවතුම් පොළ<br>-බැංකුව<br>-පාසල , කාර්යාලය ආදි විවිධ ස්ථාන ඇසුරු කර ගෙන සංවාදවල යෙදීම.<br>• පරිසරය ඇසුරෙන් සංවාදවල යෙදීම<br>තෝරා ගත් ස්ථාන හා චරිත භාවිත කරමින් සංවාදවල යෙදීම | • විවිධ ස්ථාන හා චරිත ඇසුරෙන් උචිත සංවාදවල යෙදෙයි. | • කණ්ඩායම් ක්‍රියාකාරකම් | පැය 06යි |
| 1.6 | සර්ව නාම පද විවිධාර්ථවත් ව භාවිත කිරීම | මම,අපි,එයා,ඔයා,ඔබ,ඌ ,උන්<br>- මම ,මං,මට,මගේ,මගෙන්<br>-අපි,අපේ,අපට,අපෙන්<br>-එයා,එයාට,එයාගේ,<br>එයාගෙන්,එයාලා,එයාලට,එයාලගේ,එයාලගෙන්<br>ඔබ,ඔබේ.ඔබට,ඔබගේ,ඔබගෙන්.<br>-ඌ,ඌට,ඌගේ,උගෙන්,ඌගෙන්,<br>-උන්,උන්ට,උන්ගෙන්,උන්ගේ<br>-ඒක,ඒකට,ඒකේ,ඒකෙන්<br>-ඒවා,ඒවට,ඒවායේ | • සර්ව නාම හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• සර්ව නාම විවිධාර්ථවත් ව භාවිත කරයි.<br>• සර්ව නාම පද උචිත පරිදි භාවිත කරමින් අදහස් ප්‍රකාශ කරයි. | • භූමිකා රංගනය<br>• අනුකරණය | පැය 06යි |
| 1.7 | විශේෂණ පද හඳුනා ගෙන භාවිත කිරීම | • විශේෂ ගුණ ප්‍රකාශිත නාම පද<br>-උස, මහත, කෙට්ටු, දිග, ලොකු. විශාල , රතු ,සුදු<br>• ප්‍රකෘතිය විශේෂණ වශයෙන්<br>- කුරුලු පැටව් , කුඹුරු ගොවිතැන් ක්‍රීඩා තරග , බලු කූඩුව කාර්යාල උපකරණ , පාසල් වත්ත , ගෙවතු වගා , ශිෂ්‍ය වාර්තා , ආදි වශයෙන් නාම විශේෂණ භාවිතය.<br>• ක්‍රියා විශේෂණ<br>-හයියෙන් , හෙමින් , වේගයෙන් , ඉඳහිට , හොඳින් , පැහැදිලි ව ,අඩුවෙන් ,ඉක්මනින් , පමාවෙලා ආදිය | • විශේෂණ පද යනු කුමක්දැයි පැහැදිලි කරයි.<br>• විශේෂණ පද භාවිත කරමින් අදහස් ප්‍රකාශ කරයි.<br>• ක්‍රියා විශේෂණ යනු කුමක්දැයි පැහැදිලි කරයි.<br>• ක්‍රියා විශේෂණ පද භාවිතාකරමින් අදහස් ප්‍රකාශ කරයි. | • දේශන<br>• අනුකරණය<br>• භූමිකා රංගනය | පැය 06යි |

| | | | | | |
|---|---|---|---|---|---|
| **1.8** | මග තොරතුරු විමසීම හා පැවසීම. | • මග තොරතුරු විමසීම හා පැවසීමට සුදුසු සංවාද ගොඩ නැගීමට උපකාරක වචන.<br>- ඉස්සරහට යන්න.<br>- දකුණට හැරෙන්න.<br>- වමට හැරෙන්න.<br>- තාර පාරෙන්<br>- වැලි පාරෙන්<br>- ඉස්කෝලෙ ළඟින් තියෙන පාර<br>- කෝවිල ඉස්සරහ තියෙන පාර<br>- තුන් මං හන්දියෙන් දකුණට<br>- තුන් මං හන්දියෙන් වමට<br>- පටු මග<br>- පළවෙනි පටුමගින්<br>- දෙවෙනි පටුමගින්<br><br>• විමසීම<br>-..............යන්නේ කොහොම ද?<br>-..............තියෙන්නේ කොහේ ද?<br>-..............මෙහෙන් යන්න පුළුවන් ද?<br>-..............මට යන්න පාර කියන්න පුළුවන් ද? | • තමා යා යුතු ස්ථානය පිළිබඳ ව නිවැරදි ව ප්‍රකාශ කරයි.<br>• මාර්ග විස්තරය නිවැරදි ව අසා ගෙන ප්‍රකාශ කරයි.<br>• මග සලකුණු මතකයෙන් ප්‍රකාශ කරයි.<br>• මග තොරතුරු විමසීම සඳහා උචිත ප්‍රශ්න භාවිත කරයි.<br>• ප්‍රශ්න නගමින් යා යුතු මාර්ගය නිශ්චිත ව නිවැරදි ව අවබෝධ කර ගෙන ප්‍රකාශ කරයි. | • ආදර්ශනය<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>• භූමිකා රංගනය | පැය 06යි |
| **1.9** | අවබෝධයෙන් යුතුව අංක භාවිත කිරීම | • අංක 1 සිට 30 තෙක්<br>- අංක 40,50,60, ආදි වශයෙන් දශක සංඛ්‍යා 100 තෙක්<br>-100, 1000 තෙක්<br>• -10000 -100000, 1000000, 100000000 (සීය ,දාහ ,දහ දාහ , ලක්ෂය, කෝටිය ,මිලියනය, බිලියනය ආදි වශයෙන් | • සංඛ්‍යා පිළිබඳ දැනුම ප්‍රකාශ කරයි.<br>• දශක සංඛ්‍යා නිවැරදි ව ප්‍රකාශ කරයි<br>• ශතක සංඛ්‍යා නිවැරදි ව ප්‍රකාශ කරයි | • දේශන<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>• කේවල ක්‍රියාකාරකම් | පැය 06යි |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1.10 | කාලය පිළිබඳ ව අවබෝධයෙන් යුතුව අදහස් ප්‍රකාශ කිරීම | • සතියේ දින<br>-සඳුදා සිට ඉරිදා දක්වා පිළිවෙළින් ප්‍රකාශ කිරීම<br>• ඉදිරි දින හා ගත වූ දින ප්‍රකාශ කිරීම<br>-හෙට, අනිද්දා,ඉන් අනිද්දා<br>-ඊයේ,පෙරේදා,පළමු දා<br>-අවුරුද්දේ මාස දොළහ පිළිවෙළින් ප්‍රකාශ කිරීම<br>-ජනවාරි.........දෙසැම්බර්<br>• දවසේ කාලය ප්‍රකාශ කිරීම.<br>-උදේ, දවල්,හවස,රාත්‍රීය,උදේ වරුව,හවස් වරුව,පාන්දර<br>-පෙරවරු, පස්වරු<br>-ඔරලෝසුව බලා වේලාව ප්‍රකාශ කිරීම<br>8.00 අටයි<br>9.00 නවයයි<br>9. 15 නවයයි කාලයි<br>9.30 නවය හමාරයි / නවයයි තිහයි<br>9.45 නවයයි හතළිස් පහයි<br>9.50 නවයයි පනහයි<br>10.05 දහයයි පහයි<br>10. 15 දහයයි කාලයි / දහයයි පහළවයි.<br>10.20 දහයයි විස්සයි | • කාලය පිළිබඳ දැනුම ප්‍රකාශ කරයි.<br>• සතියේ දින නිවැරදිව පිළිවෙළින් පවසයි.<br>• වසරේ මාස පිළිවෙළින් ප්‍රකාශ කරයි.<br>• ඔරලෝසුව බලා වේලාව නිවැරදි ව ප්‍රකාශ කරයි. | • දේශන<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්<br>• කේවල ක්‍රියාකාරකම් | පැය 04යි |
| 1.11 | තාලානුකූල ගීත, කවි,ගායනය කිරීම | ජන කවි<br>-ළමා ගී<br>- ළමා කවි<br>-උපදේශ කාව්‍ය | • කවි, ගී, තාලානුකූල ව ගායනය කරයි.<br>• කවි හා ගීත මතකයෙන් ගායනා කිරීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | • කේවල ක්‍රියාකාරකම්<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් | පැය 04යි |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1.12 | මාතෘකානුකූල ව කතා කිරීම | • සරල මාතෘකා යටතේ කතා කිරීම.<br>උදාහරණ<br>-මගේ රැකියාව<br>-මගේ සුරතලා<br>-මා කැමති විද්වතා<br>-මගේ විනෝදාංශ | • උචිත මාතෘකා තෝරා ගැනීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>• වැදගත් තොරතුරු ඇතුළත් කරමින් කතා කරයි.<br>• හඬ පාලනය කරමින් කතා කරයි.<br>• කාලය උචිත පරිදි යොදා ගනිමින් කතා කරයි. | • කේවල ක්‍රියාකාරකම් | පැය 04යි |
| 1.13 | දෙන ලද විවිධ සිදුවීම් හා අවස්ථා අනුව කතා කිරීම | රිය අනතුරක්<br>-ක්‍රීඩා තරගයක්<br>-උත්සව අවස්ථාවක්<br>-කාර්යාලයේ විශේෂ අවස්ථාවක් | • අවස්ථෝචිත ව භාෂාව භාවිත කරයි.<br>• හඬ පාලනය කරමින් අදහස් ප්‍රකාශ කරයි.<br>• හැඟීම් දනවන පරිදි අදහස් ප්‍රකාශ කරයි. | • කේවල ක්‍රියාකාරකම්<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් | පැය 04යි |
| 1.14 | සිංහල භාෂාවෙන් දෙමළටත් දෙමළ භාෂාවෙන් සිංහලටත් ලේඛන පරිවර්තනය කර අදහස් ප්‍රකාශ කිරීම. | • ඡේද පරිවර්තනය කිරීම<br>-නිවේදන<br>-රාජකාරි ලිපි<br>-ආරාධනා පත්‍ර<br>-නාම පුවරු | • ලේඛන පැහැදිලි ව හා නිවැරදි ව කියවා අදහස් ප්‍රකාශ කරයි | • කේවල ක්‍රියාකාරකම්<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් | පැය 04යි |

| | | | | | |
|---|---|---|---|---|---|
| 1.15 | චිත්‍රයක් ,පින්තූරයක් ඇසුරෙන් විස්තර කිරීම | • දෙන ලද පින්තූරයක් හෝ චිත්‍රයක් බලා එහි අන්තර්ගත දේ විස්තර කිරීමට යොමු කිරීම<br>-චිත්‍රය හෝ පින්තූරයේ සමස්තය හඳුනා ගෙන ප්‍රකාශ කිරීම<br>-ප්‍රධාන අංග විස්තර කිරීම<br>-පසුබිම / අවට පරිසරය විස්තර කිරීම ආදිය | • චිත්‍රයේ / පින්තූරයේ තේමාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි<br>• විස්තරාත්මක ව කරුණු එකින් එක ප්‍රකාශ කරයි. | • කේවල ක්‍රියාකාරකම් | පැය 06යි |
| 1.16 | විද්‍යුත් මාධ්‍ය ප්‍රවෘත්තිවලට සවන් දී අන්තර්ගතය ප්‍රකාශ කිරීම. | • ගුවන් විදුලි,රූපවාහිනි ආදි ප්‍රවෘත්ති වල අන්තර්ගතය සංක්ෂිප්ත ව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම<br>• පටිගත කරන ලද එවැනි ප්‍රවෘත්ති ඇසුරෙන් ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීම | • අවධානයෙන් යුතු ව සවන් දීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>• වැදගත් තොරතුරු මතකයෙන් ඉදිරිපත් කරයි. | • කේවල ක්‍රියාකාරකම්<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් | පැය 04 යි |
| 1.17 | විවිධ සංවාද , කතා සාකච්ඡාවලට සවන් දී නිවැරදි ව ප්‍රතිචාර දැක්වීම | • විවිධ දේශකයන්ගේ පටිගත කරන ලද<br>- දේශන<br>- සංවාද | • දේශනවලට සවන් දී වැදගත් කරුණු ප්‍රකාශ කරයි.<br>• උචිත ප්‍රශ්න නඟමින් කරුණු තහවුරු කර ගෙන ඉදිරිපත් කරයි.<br>• වැදගත් කරුණු විස්තර කරයි. | • කේවල ක්‍රියාකාරකම්<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් | පැය 04යි |
| 1.18 | ආචාරශීලී ව කතා කිරීම | • ආමන්ත්‍රණය කිරීම හා අවසර ගැනීම<br>• පිළිගැනීමේ කතා පැවැත්වීම<br>• ස්තුති කතා පැවැත්වීම<br>• උචිත පරිදි සාම්ප්‍රදායික යෙදුම් භාවිත කිරීම | • ආචාරශීලී බව ප්‍රදර්ශනය කරමින් කතා කරයි.<br>• උචිත වචන භාවිත කරයි. | • කේවල ක්‍රියාකාරකම් | පැය 06යි |
| 2.00 | කියවීම. | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **2.1** | වචන පැහැදිලි ව හා නිවැරදි ව උච්චාරණය කරමින් කියවීම | කතාන්දර<br>- කෙටි කතා<br>- කෙටි ඡේද ආදිය. | • වචන , වාක්‍යාංශ හා වාක්‍ය පැහැදිලි ව හා නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි | • ආදර්ශනය<br>• කේවල ක්‍රියාකාරකම් | පැය **06යි** |
| **2.2** | පිලි හා ව්‍යඤ්ජන සංකේත කෙරෙහි සැලකිලිමත් වෙමින් කියවීම | • කා , කැ , කෑ , කි , කී , කු , කූ , ආදි වශයෙන්<br>• ව්‍යඤ්ජන සංකේත<br>-රේඵය - සජී<br>-රකාරාංශය ෟ - ප්‍රමාණය<br>-යංශය ්‍ය - සාහිත්‍ය | • වචන , වාක්‍යාංශ වාක්‍ය පැහැදිලි ව හා නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි | • ආදර්ශනය<br>• කේවල ක්‍රියාකාරකම් | පැය **06යි** |
| **2.3** | අසන්නාගේ අවධානය යොමු කර ගනිමින් කියවීම | - ප්‍රවෘත්ති<br>- නිවේදන<br>- වාර්තා කියවීම | • නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි.<br>• විරාම ලක්ෂණ කෙරෙහි අවධානයෙන් යුතු ව කියවයි.<br>• පැහැදිලි ව හඬ පාලනය කරමින් කියවයි.<br>• අවබෝධයෙන් යුතු ව කියවයි. | • ආදර්ශනය<br>• භූමිකා රංගනය | පැය **06යි** |
| **2.4** | ලේඛන කියවා අවබෝධයෙන් යුතු ව ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම | • අවබෝධය මැනීම සඳහා සුදුසු ඡේද | • අර්ථාවබෝධයෙන් යුතු ව ඡේද කියවයි.<br>• ඉදිරිපත් කර ඇති ප්‍රශ්නය නිවැරදි ව අවබෝධ කර ගෙන පිළිතුරු ප්‍රකාශ කරයි.<br>• නිවැරදි ව පිළිතුරු සැපයීමේ දක්ෂතා ප්‍රදර්ශනය කරයි. | • කේවල ක්‍රියාකාරකම් | පැය **12යි** |
| **3.00** | ලේඛනය. | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |
| **3.1** | සිංහල අක්ෂර මාලාව හැඳින ගැනීම | • අක්ෂර 60 කින් යුක්ත සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ලිවීමට යොමු කිරීම | • සිංහල අක්ෂර මාලාව හඳුනා ගෙන ප්‍රකාශ කරයි<br>• ස්වර ව්‍යඤ්ජන අක්ෂර ලියා දක්වයි. | • ආදර්ශනය<br>• කේවල ක්‍රියාකාරකම් | පැය 10යි |
| **3.2** | • හැඩය, ප්‍රමාණය දිශාව අනුව සම්මත ආකාරයට අක්ෂර ලිවීම | • සිංහල අක්ෂර මාලාව<br>-ස්වර<br>-ව්‍යඤ්ජන<br>- ස්වර සංකේත<br>- ව්‍යඤ්ජන සංකේත<br>• පිල්ලම් රහිත වචන ලිවීමට හුරු කිරීම<br>-පිල්ලම් සහිත වචන ලිවීම<br>- ව්‍යඤ්ජන සංකේත සහිත වචන ලිවීම<br>(රකාරාංශය, රේඵය , යංශය) | • සම්මත හැඩය හා ප්‍රමාණයට අනුව අක්ෂර ලියයි.<br>• නිවැරදි පිල්ලම් භාවිත කරමින් ලියයි. | • ආදර්ශනය<br>• කේවල ක්‍රියාකාරකම් | පැය 10 යි |
| **3.3** | අක්ෂර වින්‍යාසය කෙරෙහි යොමු කරමින් ලේඛනයේ යෙදීම. | • න , ණ<br>ල , ළ<br>ශ , ෂ , ස , ළ ආදි<br>• අකුරු නිවැරදි ව වචනවල යෙදීමට හුරු කිරීම<br>• අල්පප්‍රාණ මහප්‍රාණ අක්ෂර උචිත අයුරින් වචන වල යෙදීම. | • න , ණ ,ල , ළ භේදය කෙරෙහි සැලකිලිමත් වෙමින් ලේඛනයේ යෙදෙයි | • ආදර්ශනය<br>• කේවල ක්‍රියාකාරකම් | පැය 10යි |
| **4.0** | ව්‍යාකරණ | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **4.1** | සිංහල භාෂාවේ පද හඳුනා ගෙන භාවිත කිරීම. | නාම පද - සර්ව නාම පද<br>-පුරුෂත්‍රය<br>උත්තම පුරුෂ<br>මධ්‍යම පුරුෂ<br>ප්‍රථම පුරුෂ<br>-ක්‍රියා පද පුරුෂත්‍රයට අනුව භාවිතය<br>උත්තම පුරුෂ<br>මධ්‍යම පුරුෂ<br>ප්‍රථම පුරුෂ | • නාම පද පුරුෂත්‍රයට අනුව හඳුනා ගෙන භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.<br>• ක්‍රියා පද පුරුෂත්‍රයට අනුව හඳුනා ගෙන භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි. | • ආදර්ශනය<br>• කේවල ක්‍රියාකාරකම්<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් | පැය **10** යි |
| **4.2** | නිපාත හා උපසර්ග හඳුනා ගෙන ලේඛනයේ යෙදීම | • නිපාත වාක්‍යයේ මුල මැද අග යෙදීම<br>• නිපාත විවිධාර්ථවත් ව භාවිත වන අයුරු<br>සමග , හා , ද , නිසා , විසින් , මෙන්, සේ, වගේ , ආදි නිපාත පද භාවිතය<br>• උපසර්ග - ප, පර, අව, ස, අනු, නි, දු, වි, කු, අ, ඔ, අදි, අබි , අප, පස් , පිළි, අති, පි, සු, උප.<br>ආදි උපසර්ග යෙදෙන ආකාරය නිදසුන් සහිත ව පැහැදිලි කිරිම<br>• උපසර්ග නිසා අර්ථය දීප්තිමත් වන අයුරු , විරුද්ධාර්ථය ප්‍රකාශ වන අයුරු නිදසුන් සහිතව පැහැදිලි කිරිම | • නිපාත පද හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• නිපාත පද අර්ථවත් ව භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි.<br>• විවිධාර්ථවත් ව නිපාත පද භාවිත වන බව ප්‍රකාශ කරයි.<br>• නිපාත පද වාක්‍යයක මුල, මැද,අග යන ස්ථානවල යෙදෙන බව පවසයි.<br>• උපසර්ග හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• උපසර්ග වචනයේ අර්ථය කෙරෙහි බලපාන ආකාරය ප්‍රකාශ කරයි.<br>• උපසර්ග නිවැරදි ව වචනවල භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි. | • ආදර්ශනය<br>• කේවල ක්‍රියාකාරකම්<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම් | පැය **06** යි |

| | | | | | |
|---|---|---|---|---|---|
| **4.3** | උක්ත ආඛ්‍යාත සම්බන්ධය පිළිබඳ මනා අවබෝධයෙන් යුතු ව ලේඛනයේ යෙදීම | • උක්තය හා ආඛ්‍යාතය අතර සම්බන්ධ රීති හඳුනාගෙන වාක්‍ය ලිවීම<br>• මූලික රීති හඳුනා ගැනීම<br>• සකර්මක හා අකර්මක වාක්‍ය<br>• ත් , ද ,සමග උක්ත පද සම්බන්ධ වන විට ආඛ්‍යාතය යෙදීම<br>• ඇත නැත යෙදීම<br>• යුතුය මැනවි ආදි යෙදුම් සහිත වාක්‍ය තැනීම | • වාක්‍ය රීති අනුගමනය කරමින් ලේඛනයේ යෙදෙයි. | • ආදර්ශනය<br>• කේවල ක්‍රියාකාරකම් | පැය **10**යි |
| **4.4** | ඡේද ලිවීම | • කෙටි ඡේද ලිවීම<br>• ශිල්පීය ප්‍රයෝග භාවිත කිරීම<br>- විරාම ලකුණු යෙදීම.<br>- ඡේද වෙන් කිරීම. | • වාක්‍ය ගළපමින් ඡේද ලියයි.<br>• ශිල්පීය ප්‍රයෝග භාවිත කරමින් ලේඛනයේ යෙදෙයි | • ආදර්ශනය<br>• කේවල ක්‍රියාකාරකම් | පැය **08** යි |